# සාම විගඩම

කොටි ත්‍රස්තවාදීහු ඊනියා සාම සාකච්ඡාවලට ප්‍රථම ක්ලේමෝ බෝම්බ පුපුරුවා ඝාතන වැලක්ම සිදුකළහ. මේ ලිපිය ලියන මොහොතෙහි සාම විගඩම කෙසේ තාවකාලිකව කෙළවරවන්නේ දැයි නිශ්චිතව කිවහැකි නොවෙයි. ඇතැම් විට විසිහතර හා විසිපහ ඊනියා සාම සාකච්ඡා නොපැවැත්වීමටද ඉඩක් ඇත. එහෙත් එයින් කියැවෙන්නේ කිසි දිනෙක කොටි ඊනියා සාම සාකච්ඡාවලට නොපැමිණෙන්නේ ය යන්න නොවෙයි. කොටින්ට ලබන සතියේ නොවුණද සාකච්ඡාවලින් තොර විකල්පයක් නැත. ඔවුන්ට ඊළම දිනාගත හැක්කේ ඊනියා සාම සාකච්ඡාවලින්ම පමණකි. ඊනියා සාම සාකච්ඡා සඳහා භාවිතා කළයුතු නම ඊළාම් සාකච්ඡා යන්නය. මේ වන විට සාම විගඩම ගැන යම් පිරිසකට හෝ අවබෝධයක් ඇත. එහි පිටපත මෙසේය. ඊළාම් කතා සඳහා දින නියම කරගනු ලැබෙයි. එහිදී ඊළමක් සඳහා පහසුකම් සපයන්නා වූ නෝර්වේ අනෙක් බටහිර ක්‍රිස්තියානි රටවලද අනුදැනුම ඇතිව විශාල කාර්යභාරයක් ඉටුකරයි. දිනය ළංවත්ම කොටි ත්‍රස්තවාදීහු ක්ලේමෝ බෝම්බ පිපිරවීමට කටයුතු කරති. කොටි ඊනියා සාම කතාවලට විරුද්ධ ය යන මතය පැතිර යයි. එහෙත් කොටින්ට ඊනියා සාම කතාවලින් හැරෙන්නට ඊළම දිනාගත නොහැකිය. ඔවුන්ට ලංකාණ්ඩුවේ හමුදා සමග සටන් කර ඊළම දිනාගත නොහැකි බව මේ වන විට ඔවුන් ඔප්පු කර අවසානය. කරුණාගේ කණ්ඩායම පරාජය කළ නොහැකි කොටින්ට ලංකාණ්ඩුවේ හමුදා පරාජය කළ හැකි දැයි යමකුට ඇසිය හැකිය. ප්‍රශ්නයට පිළිතුරු කෙසේවත් නොහැකිය යන්නය.

ඊළාම් කතා ආසන්නයේදී කොටි බෝම්බ පුපුරුවන්නේ ඔවුන්ට අවශ්‍ය නම් සටන් මගින් හමුදාව පරාජය කිරීමට හැකිය යන්න සිංහලයන්ට ඒත්තු ගැන්වීමටය. ඒ ඔවුන්ගේ ඊනියා නිජබිම් සංකල්පය, අවුරුදු දහස් ගණනක මෙරට දෙමළ ඉතිහාසය, දෙමළ ජනයාට දෙමළවීම නිසා සිදු වී ඇති අසාධාරණය ආදිය මෙන්ම කෙප්පයකි. බෝම්බ පුපුරුවන අතර කොටි විවිධ ඉල්ලීම් ඉදිරිපත් කරති. ඒ ඉල්ලීම්වල අරමුණ අවසානයේදී ඊළම දිනාගැනීමය. උදාහරණයක් ලෙස මේ දිනවල කොටි ඉදිරිපත් කරන ඉල්ලීම් තුනක් වෙයි. පළමුවෙන් කරුණා කණ්ඩායම නිරායුධ කිරීමය. කරුණා යහපත් පුද්ගලයෙක් නොවෙයි. එහෙත් අපට කරුණා නිරායුධ කිරීම දැනට අනවශ්‍යය. කරුණාගේ කණ්ඩායම පාර හමුදාවක් (පැරා මිලිටරි ෆෝර්ස්) යැයි කොටි ත්‍රස්තවාදීහු පවසති. පාර හමුදාවක් යන්නෙහි තේරුම කොටි නොදන්නවා සේය. ඒ කෙසේ වෙතත් අප කියන්නේ කරුණා පාර්ශ්වය පාර හමුදාවක් නම් කොටිද පාර හමුදාවක් බවය. එබැවින් කරුණා නිරායුධ කිරීමට පෙර කොටි නිරායුධ කළ යුතුය. කරුණා කොටින්ගෙන් වෙන් වූ විගස කොටි කීවේ තමන්ට කරුණා මෙල්ල කළ හැකි බවත් ආණ්ඩුව එයට අත නොතැබිය යුතු බවත්ය. අද කොටි ආණ්ඩුවට කරුණා නිරායුධ කිරීමට යැයි කියන්නේ තමන්ගේ ශක්තියේ තරම ගැන අවබෝධයක් ඇති බැවිනි. කරුණාද ඇතැම් කරුණු අතින් ගත්කල යාපන විශ්වවිද්‍යාලයේ උපකුලපති ලෙස පත්කර ඇති මහාචාර්ය ආර්. හූල් මෙනි, මහාචාර්ය හූල්ට කොටි විරුද්ධය. කොටි ඔහු මරාදැමීමට තර්ජනය කරති. කොටි හෝ වෙනත් අයකු හෝ කවුරු මරාදැම්මද අපි එයට විරුද්ධ වෙමු. එහෙත් මහාචාර්ය හූල් සැමදාමත් සිංහලයන්ට, විශේෂයෙන්ම සිංහල බෞද්ධයන්ට, එරෙහිව කටයුතු කළ බව අමතක නොකළ යුතුය. ඒ බව විශ්වවිද්‍යාල මෙන්ම වෘත්තීයමය සංවිධානවල ක්‍රියාකාරීව කටයුතු කරන්නෝ දනිති. එහෙත් අපට කරුණාට මෙන්ම මහාචාර්ය හූල්ටද විරුද්ධව ක්‍රියාකිරීමේ අවශ්‍යතාවක් දැනට පැන නොනගී. අද කොටින්ගේ දෙවැනි ඉල්ලීම වී ඇත්තේ ඔවුන්ටද නාවික හමුදාවක් පිහිටුවීමට අයිතිය ලබාදීමය. කොටි නාවික හමුදාවට විරුද්ධව ක්‍රියාකරන්නේ ඒ පදනමින්ය. තුන්වැනුව ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ කිලිනොච්චියේ සිට කෙළින්ම පිටරට යෑමට ඉඩ ලබාගැනීමටය. කොළඹ නොපැමිණ රජයේ ආගමන හා විගමන මෙන්ම රේගු නීතිරීතිද උල්ලංඝනය කරමින් කිලිනොච්චියේ සිට කෙලින්ම පිටරට යෑමෙන් ඔවුන් බලාපොරොත්තුවන්නේ ඔවුන් ලංකාවෙන් නොව වෙනත් රටකින් ගිය බව කීමටය. මේ ඉල්ලීම්වල පදනමේ ඇත්තේ ඊළම බව පැහැදිලිය.

සාම විගඩමේ තිර රචනයට අනුව කොටි එසේ බෝම්බ ගසමින් ඉල්ලීම් ඉදිරිපත් කරමින් සිටින විට බටහිර ක්‍රිස්තියානි රටවල මැදිහත්කරුවා වූ ද ඊළමට පහසුකම් සපයන්නා වූද නෝර්වේ හා ඊනියා ආධාර කණ්ඩායමේ සම සභාපතිවරු ඉදිරිපත් වී කෙසේ හෝ ඊළාම් සාකච්ඡාවලට සහභාගිවන්නැයි කොටින්ට කන්නලව් කරති. එවිට කොටි ඒ සමග හෝ කල්ගතවීමෙන් පසුව හෝ ජාත්‍යන්තර ප්‍රජාව නමින් හැඳින්වෙන කැරොල් කරත්තයේ "බලපෑමට" ගරු කිරීමක්

© Prof. Nalin De Silva

වශයෙන් යැයි කියමින් ඊළම් කතාවලට පැමිණෙති. කොටි එලෙස ඊනියා සාම සාකච්ඡාවලට පැමිණීම මහා ජයග්‍රහණයක් යැයි ආණ්ඩුව හා බටහිරයෝ අවශේෂ ලෝකයට ප්‍රකාශ කරති. ඊනියා සාම සාකච්ඡාවල දීත් කොටි විවිධ ඉල්ලීම් ඉදිරිපත් කරති. සාකච්ඡාවලින් නැගිට යෑමට තර්ජනය කරති. ඒ සියල්ල ඊළම දිනා ගැනීමටය. බටහිරයන් මැදිහත්ව ඒ බොරු තර්ජන සියල්ල සමනයකට පත්කෙරෙයි. මේ සාම විගඩම වහාම අත්හැරිය යුතුය. වහාම ඊළම් කතාවල අවසානයක් දැකිය යුතුය. අද ආණ්ඩුව කිවයුත්තේ හැකිනම් සටන්කර ඊළම ලබාගනිව් යන්නය. ඒ අතර ආණ්ඩුව හමුදාව ශක්තිමත් කර භටයන්ගේ චිත්ත ධෛර්යය නංවා කොටි පරාජය කිරීමට කටයුතු කළ යුතුය. එහෙත් ආණ්ඩුවට එසේ කිරීමට ඇමරිකන් එක්සත් ජනපදය හා බ්‍රිතානිය ප්‍රමුඛ බටහිර රටවල් ඉඩ නොදෙයි.

අද ආණ්ඩුවේ ඇමරිකන් බලපෑම ඉතා අධිකය. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වටා සිටින්නවුන් අතර ඇමරිකාවේ පදිංචිව සිට පැමිණියෝද වෙති. සාම ලේකම් මණ්ඩලයේ කොහොන මහතාද ඇමරිකාවෙන් ආනයනය කරනු ලැබුවෙකි. ඔහු පසුගියදා කොටි ත්‍රස්තවාදීන් ආරක්‍ෂා කරන අන්දමේ ප්‍රකාශයක් කර තිබිණි. රාජපක්ෂ මහතා ජනාධිපති වූයේ සිංහලයන්ගේ විශේෂයෙන්ම සිංහල බෞද්ධයන්ගේ ඡන්දයෙන් බව ඒ මහතා වටා සිටින්නවුන්ට නිතර නිතර මතක් කර දිය යුතු වෙයි. රාජපක්ෂ මහතා බලයට පත් කිරීමට තඹ දොයිතුවකද වැඩක් නොකළ පිරිස් අද රාජ්‍ය තන්ත්‍රය හැසිරවීම €දජනකය. ඔවුන් මහින්ද චින්තන ගැන දන්නා ඉට්ගෙඩියක් නැත. මේ බොහෝ පිරිස් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල බැළයෝද බටහිර දැනුම මෙරට ප්‍රචලිතකරන්නෝ ද සවිඥානිකව හෝ අවිඥානිකව හෝ ඇමරිකන් (බටහිර) නියෝජිතයෝ පමණක්ම වෙති. අද ආණ්ඩුවට බටහිරයන් විසින් කෙරෙන බලපෑම ඉතා අධිකය. බටහිර රටවල කෙරෙන කොටි තහනම් නිසා අප මුළා විය යුතු නොවෙයි. පසුගියදා කැනඩාව කොටි සංවිධානය තහනම් කළේය. ඒ සම්බන්ධයෙන් එරට හා වෙනත් රටවල සිටින සිංහලයන් විසින් කරන ලද කාර්යය අප ඇගයිය යුතු වුවද ඒ තහනම එතරම් වැදගත් දෙයක් නොවෙයි. කැනඩා පොලිසිය කොටි කාර්යාලයක් වටලා ඇත. එහෙත් ඒ එකකින්වත් කොටින්ගේ කාර්යයන්ට තර්ජනයක් නොවෙයි. අප තේරුම්ගත යුතු පළමු කාරණය වනුයේ බටහිර රටවල් කොටි තහනම් කරන්නේ කොටි යම් ආකාරයකින් ඒ රටවලට ප්‍රශ්නයක් වී ඇති බැවින් මිස කොටි අප රටට කරන හානිය ගැන සැලකිලිමත් වීමෙන් නොවන බවය. කැනඩාව කොටින්ට පළමු සංවිධාන තිස් ගණනක් තහනම් කර ඇත. අල් ක්වයිදා වැනි සංවිධානයක් හැරුණු කොට මේ බොහොමයක් සංවිධාන කොටින් සමග සංසන්දනය කිරීමේදී ළමා සංවිධාන වෙයි. ඒ සංවිධාන තහනම් කර කාලයක් ගතවීමෙන් පසු කැනඩාව කොටි සංවිධානය තහනම් කළේ ඇයි? නැතහොත් කොටි තහනම් කිරීමට කැනඩාව මෙපමණ කාලයක් බලා සිටියේ ඇයි? බ්‍රිතානියේ කොටි සංවිධානය තහනම් කෙරී ඇත. එහෙත් ඇන්ටන් බාලසිංහම් එරට පුරවැසියකු ලෙස එහි යහතින් කල්ගෙවයි. ඒ රටවල කොටි තහනම් කෙරී ඇත්තේ ලංකාවේ ප්‍රශ්නයකට අදාළව නොවන බව සිංහලයන් හැකි ඉක්මණින් තේරුම්ගැනීම වැඩදායකය.

බටහිර රටවල් කොටි ගැන සිතන්නේ දෙමළ ජනයාගේ ඊනියා නිදහස වෙනුවෙන් සටන් කරන සංවිධානයක් ලෙසය. පසුගියදා විශ්‍රාම ගිය ඊනියා නිරීක්‍ෂණ කමිටුවේ සභාපතිවරයා වූ හෝක්ලන්ඩ් ඒ බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. සෝල්හයිම් නම් නරපණුවා ඉන්දියාවේදී ප්‍රකාශ කර තිබුණේ කොටි ඉල්ලීම් ලබාදිය යුතු බවය. පසුගියදා ලංකාණ්ඩුව ජනාධිපති රාජපක්ෂ මහතාට බ්‍රිතානියේ බ්ලෙයාර් නම් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදියා මුණ ගැසීමට අවශ්‍ය යැයි දැනුම් දුන් විට ආණ්ඩුව දෙමළ ජනයාට අසාධාරණ ලෙස සලකන බැවින් මේ ඒ සඳහා කාලය නොවේ යැයි මෙරට බ්‍රිතානි මහා කොමසාරිස් කාර්යාලය පැවැසීය. බටහිර ක්‍රිස්තියානි රටවල් එදත් අදත් හෙටත් සිතන්නේ දෙමළ ජනයාට සිංහලයන්ගෙන් විශාල අසාධාරණයක් සිදුවී ඇති බවත් කොටි නිදහස් සටනක යෙදී සිටින බවත්ය. ඔවුන්ට ඒ එසේ නොවන බව පැහැදිලි කර දිය නොහැක්කේ ප්‍රශ්නයේ ආරම්භකයන් හා ප්‍රශ්නයට හේතුව ඔවුන්ම බැවින්ය. මෙරට අද ජීවත්වන දෙමළ ජනයා එළාරගේ කාලයේ සිට හෝ දාඨිය පීඨියලාගේ කාලයේ සිට හෝ පමණක් නොව සන්කිලිගේ කාලයේ සිට හෝ දෙමළ ජනයාගෙන් පැවතෙන්නෝ නොවෙති. ඔවුන් ඉතා වැඩි වශයෙන් පැවතෙන්නේ ලන්දේසීන් විසින් දුම්කොළ වගාවට මෙරටට දකුණු ඉන්දියාවේ කෝරමණ්ඩල් වෙරළ ආශ්‍රිත ප්‍රදේශයෙන් ගෙන්වනු ලැබූ ගොවියන්ගෙනි. මේ ගොවියෝ මෙරටදී වෙල්ලාලයෝ වූහ. ඉංගිරිසීහු පසුව මොවුන්ට විශේෂ වරප්‍රසාද දුන්හ. අද බටහිරයන් හා ඔවුන්ගේ සුවච සේවකයන් වූ දෙමළ නායකයන් දෙමළ ජනයාට සිදු වූ අසාධාරණය ලෙස පෙන්වන්නේ මේ වරප්‍රසාද ටිකෙන් ටික ඉවත් කිරීමය. සිංහලයන්ද මෙරට දෙමළ ඉතිහාසය හරිහැටි නොදන්නා කල

© Prof. Nalin De Silva

ප්‍රශ්නය විසඳන්නේ කෙසේද? බටහිරයන් හා ඔවුන්ගේ අනුග්‍රහයෙන් සිදුවන සාකච්ඡා ප්‍රතික්ෂේප කර සාම විගඩමේ නළු නිළියන් හෝ ප්‍රේක්ෂකයන් හෝ නොවී දෙමළ ජාතිවාදය පරාජය කිරීමට වෙනත් මගක් ගත යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva